

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඊ (1) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සිව්වැනි වාර්තාව

2024 ජූනි මාසය සිට 2024 දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය සඳහා

இலங்கை சனநாயக சோசலிசக் குடியரசின் அரசியலமைப்பின் உறுப்புரை 41எ (1) இன் பிரகாரம் சமர்ப்பிக்கப்பட்ட அரசியலமைப்புப் பேரவையின் நான்காவது அறிக்கை

2024 ஜூன் முதல் 2024 டிசம்பர் வரையிலான காலப்பகுதிக்கானது

The Fourth Report of the Constitutional Council submitted in terms of the Article 41G (1) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka

For the period from June 2024 to December 2024

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඌ (1) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සිව්වැනි වාර්තාව

2024 ජුනි මස සිට 2024 දෙසැම්බර් මස දක්වා කාල පරිච්ඡේදය සඳහා

1 අන්තර්ගතය

1. හැඳින්වීම 1

2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට සාමාජිකයන් පත් කිරීම 1

3. සභාවේ රැස්වීම් 2

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාවේ දක්වා ඇති කොමිෂන් සභාවල සාමාජිකයින් පත් කිරීම සඳහා සභාවේ නිර්දේශය 2

4.1 ජාතික පොලිස් කොමිෂන් සභාවට සාමාජිකයකු පත් කිරීම සඳහා සභාවේ නිර්දේශය 2

4.2 රාජ්‍ය සේවා කොමිෂන් සභාවට සාමාජිකයකු පත් කිරීම සඳහා සභාවේ නිර්දේශය 3

4.3 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු ඉවත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය 3

4.4 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව (CIABOC) සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම සඳහා වූ සභාවේ නිර්දේශය 4

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශ අනුමත කිරීම් / අනුමත නොකිරීම් 4

5.1 අග්‍රවිනිශ්චයකාරවරයා පත් කිරීම 4

5.2 අභියාචනාධිකරණයේ සභාපති ධුරයේ වැඩ බැලීම සඳහා පත් කිරීම 5

5.3 අභියාචනාධිකරණයට විනිශ්චයකාරවරයන් පත් කිරීම 5

5.3.1. මහාධිකරණ විනිශ්චයකාරවරයන් වන කේ.එම්.ජී.එච්. කුලතුංග මහතා, ඩී. තොටවත්ත මහතා හා ආර්.ඒ. රණරාජා මහතා සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් මහේන් සී.එල්.බී. ගොපල්ලව මහතාගේ පත් කිරීම 5

5.3.2. මහාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාර කේ.එම්.එස්. දිසානායක මහතා සහ මහාධිකරණයේ ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාර ආර්.පී. හෙට්ටිආරච්චි මහතාගේ පත් කිරීම. 6

5.4 අධිකරණ සේවා කොමිෂන් සභාවට සාමාජිකයෙකු පත් කිරීම 6

5.4.1. ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ජනාධිපති නීතිඥ ගරු විජිත් කේ මලල්ගොඩ මහතා විශ්‍රාම යාමත් සමඟ ඇති වන පුරප්පාඩුව සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවට සාමාජිකයෙකු පත් කිරීම. 6

5.4.2. අග්‍රවිනිශ්චයකාර ජනාධිපති නීතිඥ ගරු ජයන්ත ජයසූරිය මහතා විශ්‍රාම යාමත් සමඟ ඇති වීමට නියමිත පුරප්පාඩුව සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවට සාමාජිකයෙකු පත් කිරීම 7

5.5 නීතිපතිවරයා පත් කිරීම 7

5.5.1. නීතිපතිවරයා නැවත පත් කිරීම 7

5.5.2. නීතිපතිවරයා පත් කිරීම 8

5.6 විගණකාධිපති ධුරයේ වැඩ බැලීම සඳහා පත් කිරීම 8

5.7 පොලිස්පති ධුරයට පත් කිරීම 8

5.7.1. පොලිස්පති ධුරයේ වැඩ බැලීමට පත් කිරීම 8

6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැර වෙනත් ලිඛිත නීති මගින් සභාව වෙත පනවා හෝ පවරා ඇති කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීම 9

6.1 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට (OMP) සාමාජිකයන් පත් කිරීම 9

6.1.1. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙහි සාමාජික ධුරයේ පුරප්පාඩු වූ තනතුරු හතර සඳහා සාමාජිකයින් පත් කිරීම 9

6.1.2. එච්.එම්.එම්.බී. ජයවර්ධන මහතා සහ පී.එම්.ඩබ්ලිව් සම්පත් පෙරේරා මහතා ඉල්ලා අස්වීම හේතුවෙන් ඇතිවූ පුරප්පාඩු දෙක සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සඳහා සාමාජිකයන් පත්කිරීම 10

6.2 හානිපූරණය සඳහා වන කාර්යාලයට සාමාජිකයෙකු පත් කිරීම 10

6.3 ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ (PUCSL) සභාපතිවරයා සහ සාමාජිකයින් පත් කිරීම… 10

6.4 කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට (NCW) සාමාජිකයින් පත් කිරීම 11

7. 2016 අංක **12** දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම 12

8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් වශඋත්තරකරුවන් ලෙස සඳහන් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ලැබ ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම්:- 12

1. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ (මෙහි මින් ඉදිරියට ''ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව'' ලෙසද හැඳින්වෙන) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව (මෙහි මින් ඉදිරියට ''සභාව'' ලෙසද හැඳින්වෙන) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අනෙකුත් නීති මගින් පවරා ඇති කාර්යය සහ කර්තව්‍යය කිරීම සහ ඉටු කිරීමට පවරනු ලැබ ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඵ (1) ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව 2024 ජූනි සිට 2024 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් කරන ලද සහ ඉටු කරන ලද කටයුතු මෙම වාර්තාව මගින් ඉදිරිපත් කරනු ලැබේ.

2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට සාමාජිකයන් පත් කිරීම

2024 ජනාධිපතිවරණයෙන් අනතුරුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ (1) (ඈ) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව ගරු විජිත හේරත් මහතා පත් කරන ලදී.

ඊට අනුකූලව, නවවැනි පාර්ලිමේන්තුව විසුරුවා හරින අවස්ථාවේ සභාවේ සංයුතිය පහත පරිදි වේ:

- ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති;
- ගරු ආචාර්ය හරිනි අමරසූරිය, අග්‍රාමාත්‍යතුමිය;
- ගරු සජිත් ප්‍රේමදාස මහතා;
- ගරු විජිත හේරත් මහතා;
- ගරු නීතීඥ සාගර කාරියවසම් මහතා;
- ගරු කබීර් හෂීම් මහතා;
- ආචාර්ය ප්‍රතාප් රාමනුජම් මහතා;
- වෛද්‍ය දිල්කුෂි අනුලා විජේසුන්දර; සහ
- ආචාර්ය දිනේෂා සමරරත්න.

2024 මහ මැතිවරණයෙන් අනතුරුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව, වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයින් පහත පරිදි පත් කරන ලදී:-

- ✔ ගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ (1) (ඈ) ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවේ සභානායක ගරු බිමල් රත්නායක, පා.ම., මහතා පත් කරන ලදී.
- ✔ ගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ(1)(ඉ)(i) ව්‍යවස්ථාවට අනුව ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරයන්ගේ බහුතර එකඟතාවය මත නාමයෝජනා කරන ලද ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම., සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- ✔ ගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ(1)(ඉ)(ii) ව්‍යවස්ථාවට අනුව, විරුද්ධ පක්ෂයේ නායකවරයා අයත් වන දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතර එකඟතාවයෙන් නාමයෝජනා කරන ලද ගරු අජිත් පී පෙරේරා මහතා, පා.ම., සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

✔ ගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ(1)(ඊ) ව්‍යවස්ථාව අනුව, ආණ්ඩුව නියෝජනය කරන සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා අයත් වන දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට අයත් මන්ත්‍රීවරයන් නොවන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ එකඟතාවය මත නාමයෝජනා කරන ලද ගරු සිවඥානම් ශ්‍රීදරන් මහතා, පා.ම., සභාවේ සාමාජිකයකු ලෙස පත් කරන ලදී.

ඊට අනුකූලව, සභාවේ වර්තමාන සංයුතිය පහත පරිදි වේ:-

- ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා, පා.ම., කථානායකතුමා සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති
- ගරු ආචාර්ය හරිනි අමරසූරිය, පා.ම., අග්‍රාමාත්‍යතුමිය
- ගරු සජිත් ප්‍රේමදාස මහතා, පා.ම., පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා
- ගරු බිමල් රත්නායක මහතා, පා.ම.
- ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම.
- ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.
- ගරු සිවඥානම් ශ්‍රීදරන් මහතා, පා.ම.
- ආචාර්ය ප්‍රතාප් රාමනුජම් මහතා
- වෛද්‍ය දිල්කුෂි අනුලා විජේසුන්දර
- ආචාර්ය දිනේෂා සමරරත්න

3. සභාවේ රැස්වීම්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සමාලෝචිත කාල සීමාව තුළ පහත දිනයන් තුළ අවස්ථා දහසයකදී (16) රැස්විය:-

2024.06.04, 2024.06.10, 2024.06.18, 2024.06.26, 2024.07.09, 2024.07.11, 2024.07.26, 2024.08.06, 2024.08.21, 2024.09.03, 2024.10.08, 2024.10.22, 2024.11.08, 2024.11.15, 2024.12.20, සහ 2024.12.31

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාවේ දක්වා ඇති කොමිෂන් සභාවල සාමාජිකයින් පත් කිරීම සඳහා සභාවේ නිර්දේශය

4.1 ජාතික පොලිස් කොමිෂන් සභාවට සාමාජිකයකු පත් කිරීම සඳහා සභාවේ නිර්දේශය

ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික සරත් ගාමිණී ද සිල්වා මහතාගේ අභාවය හේතුවෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවේ ඇතිවී තිබෙන පුරප්පාඩුව පිළිබඳව ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සන්නිවේදනයක් සභාව විසින් සලකා බලන ලදී.

ඊට අනුකූලව, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කිරීම සඳහා සලකා බලනු ලැබීමට, උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවමින් සභාව විසින් පුවත්පත් දැන්වීමක් පළ කරන ලදී. එම දැන්වීමට අනුව, මුල් පිටපතට අමතර එවන ලද පිටපත් අයදුම්පත්ද අසම්පූර්ණ අයදුම්පත්ද නිසි ආකෘතියට අනුව ඉදිරිපත් නොකරන ලද අයදුම්පත්ද ඇතුළුව මුළු අයදුම්පත් අසූ හතරක් (84) ලැබී තිබුණි.

සලකා බැලීමෙන් අනතුරුව, සභාව විසින්, 2024 අගෝස්තු 21 දින පවත්වන ලද සිය රැස්වීමේදී, ජයන්ත ආනන්ද ජයසිංහ මහතා ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත්කිරීමට, මූලික අයිතිවාසිකම් කඩකිරීම් සම්බන්ධව විභාග වෙමින් පවතින ඕනෑම නඩු කටයුත්තක් හෝ වරදකරුවී ඇත්ද යන්න සම්බන්ධයෙන් අයදුම්කරුගෙන් අසාධු නොවන ප්‍රතිචාරයක් ලැබීමට යටත්ව, නිර්දේශ කිරීමට සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී. අයදුම්කරු වෙතින් අසාධු නොවන වාර්තාවක් ලැබීමෙන් අනතුරුව ජයන්ත ආනන්ද ජයසිංහ මහතා ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කිරීම සඳහා වූ සභාවේ නිර්දේශය සභාව විසින් ගරු ජනාධිපතිතුමා වෙත යොමු කරන ලදී.

4.2 රාජ්‍ය සේවා කොමිෂන් සභාවට සාමාජිකයකු පත් කිරීම සඳහා සභාවේ නිර්දේශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(4) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික චන්ද්‍රරත්න පල්ලේගම මහතාගේ ඉල්ලා අස්වීම ගරු ජනාධිපතිතුමා විසින් පිළිගෙන ඇති බවට සභාවට දන්වමින් ජනාධිපති ලේකම්වරයා වෙතින් ලැබුණු සන්නිවේදනය සභාව විසින් සලකා බලන ලදී.

ඊට අනුකූලව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කිරීම සඳහා සලකා බලනු ලැබීමට, උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවමින් සභාව විසින් පුවත්පත් දැන්වීමක් පළ කරන ලදී. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සංයුතියට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 (1) ව්‍යවස්ථාවේ විධිවිධාන ද සභාව විසින් සැලකිල්ලට ගන්නා ලදී. දැන්වීමට අනුව, ප්‍රමාද වී ලද අයදුම්පත්, මුල් පිටපතට අමතර එවන ලද පිටපත් අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ නියමිත ආකෘතියට අනුව ඉදිරිපත් නොකරන ලද අයදුම්පත් ඇතුළු මුළු අයදුම්පත් එකසිය හතරක් (104) ලැබී තිබුණි.

සාකච්ඡා කිරීමෙන් අනතුරුව, සභාව විසින් මෙම පත්කිරීම සඳහා තෝරා ගැනීමේ පටිපාටියක් සඳහා එකඟ විය.

කෙටි ලැයිස්තුගත කිරීම් අවසන් කිරීමෙන් අනතුරුව, කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් 2025.01.07 දින පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවීමට සභාව විසින් තීරණය කරන ලදී.

4.3 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු ඉවත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(4) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික එන්.එච්.එම්. චිත්‍රානන්ද මහතා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයෙන් ඉවත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සඳහා සභාවේ අනුමතිය ඉල්ලා සිටිමින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් සිදු කරන ලද මූලික විමර්ශනයකට අදාළ ලිපි ලේඛනද සමඟ එවකට ජනාධිපති ලේකම්වරයා වෙතින් ලැබුණු සන්නිවේදනය සභාව විසින් සලකා බලන ලදී.

සභාව විසින් මේ සම්බන්ධයෙන් ගරු නීතිපතිතුමාගේ මතය ද ලබා ගන්නා ලදී.

ගරු නීතිපතිතුමාගේ මතය ලැබීමෙන් අනතුරුව, සභාව විසින්, 2024 ඔක්තෝම්බර් 08 වැනි දින පැවති සිය රැස්වීමේදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(4) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව එන්.එච්.එම් චිත්‍රානන්ද මහතා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයෙන් ඉවත් කිරීමට

හිටපු ජනාධිපතිතුමා විසින් කරන ලද නිර්දේශයට අදාළව වත්මන් ජනාධිපති ගරු අනුර කුමාර දිසානායක මහතාගේ ස්ථාවරය තහවුරු කර ගැනීමට ඒකමතිකව තීරණය කරන ලද අතර, ගරු නීතිපතිතුමාගේ මතයෙහි පිටපතක් ගරු ජනාධිපතිතුමාගේ අවධානය සඳහා ඉදිරිපත් කිරීමට වැඩිදුරටත් තීරණය කරන ලදී.

4.4 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව (CIABOC) සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම සඳහා වූ සභාවේ නිර්දේශය

ඩබ්ලිව්.කේ.ඩී. විජේරත්න මහතා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයෙන් ඉල්ලා අස්වීමත් සමග ඇති වී තිබෙන පුරප්පාඩුවට අනුව 2023 අංක 28 දරන පනත මගින් සංශෝධිත 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන වලට අනුකූලව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයට පත් කිරීම සඳහා නිර්දේශ කිරීම පිණිස ඒ සඳහා සුදුසු තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවීමට සභාව විසින් 2024 ඔක්තෝම්බර් 08 වැනි දින පැවති සිය රැස්වීමේදී තීරණය කරනු ලැබ පුවත්පත් දැන්වීමක් පළ කරන ලදී.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයට පත් කිරීම සඳහා සුදුසු නිර්දේශයක් තෝරා ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නීති විශේෂඥයින්ගෙන් උපදෙස් ලබා ගැනීමට 2024 ඔක්තෝම්බර් 22 දින පැවති සිය රැස්වීමේදී සභාව විසින් තීරණය කරන ලදී. ඊට අනුකූලව, සුදුසු නිර්දේශයක් තෝරාගැනීමේ පටිපාටිය සහ තෝරා ගැනීමේ ක්‍රියාවලියේදී සලකා බැලිය යුතු වැදගත් නීතිමය කරුණු සම්බන්ධයෙන් විනිසුරු ජනාධිපති නීතිඥ බුවනෙක අලුවිහාරේ (විශ්‍රාමික) මහතා සහ ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්, ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා වෙතින් නීති උපදෙස් සභාව විසින් ලබා ගන්නා ලදී.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම සඳහා සුදුසු නිර්දේශයක් තෝරා ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාවලිය පිළිබඳ අදාළ නීතිමය ප්‍රතිපාදන සහ නීති විශේෂඥයින්ගේ අදහස් සලකා බැලීමෙන් අනතුරුව, සභාව විසින් තෝරා ගැනීමේ නිර්ණායක සහ ක්‍රියා පටිපාටිය පිළිබඳව එකඟතාවයකට පැමිණෙන ලදී. ඊට අනුකූලව, තෝරා ගැනීමේ පටිපාටියේ දක්වා ඇති නිර්ණායක මත පදනම්ව අයදුම්කරුවන් දහසය දෙනෙකු කෙටි ලැයිස්තුගත කරන ලද අතර, ඉන් දස දෙනෙක් පමණක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හමුවේ පෙනී සිටියහ. සාකච්ඡා කිරීමෙන් අනතුරුව, සභාව විසින් සම්මුඛ පරීක්ෂණයේ සවිස්තරාත්මක ඇගයීම් වාර්තාවක් සලකා බැලීමට 2024 දෙසැම්බර් 31 වැනි දින පැවති සිය රැස්වීමේදී තීරණය කරන ලදී.

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශ අනුමත කිරීම් / අනුමත නොකිරීම්

5.1 අග්‍රවිනිශ්චයකාරවරයා පත් කිරීම

වත්මන් අග්‍රවිනිශ්චයකාර ගරු ජයන්ත චන්ද්‍රසිරි ජයසූරිය මහතා 2024 දෙසැම්බර් 02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම යාම මත පුරප්පාඩු වීමට නියමිත අග්‍රවිනිශ්චයකාර ධුරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ(1) සහ 107 ව්‍යවස්ථා යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම

විනිශ්චයකාරවරිය වන ජනාධිපති නීතිඥ ගරු එම්. එන්. බී. ප්‍රනාන්දු මහත්මිය පත් කරනු සඳහා කරන ලද ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින්, 2024 නොවැම්බර් 15 වැනි දින පැවති රැස්වීමේදී, සලකා බලන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ජනාධිපති නීතිඥ ගරු එම්. එන්. බී. ප්‍රනාන්දු මහත්මිය දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ සිටින ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරිය වන බව නිරීක්ෂණය කරන ලද සභාව, වත්මන් අග්‍රවිනිශ්චයකාර ජනාධිපති නීතිඥ ගරු ජයන්ත චන්ද්‍රසිරි ජයසූරිය මහතා 2024.12.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම යෑමත් සමග පුරප්පාඩු වීමට නියමිත අග්‍රවිනිශ්චයකාර ධුරයට ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරිය වන ජනාධිපති නීතිඥ ගරු එම්.එන්.බී. ප්‍රනාන්දු මහත්මිය පත්කිරීම සඳහා වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය අනුමත කිරීමට ඒකමතිකව තීරණය කරන ලදී.

5.2 අභියාචනාධිකරණයේ සභාපති ධුරයේ වැඩ බැලීම සඳහා පත් කිරීම

අභියාචනාධිකරණයේ සභාපති ගරු එන්. බී. පී. ඩී. එස්. කරුණාරත්න මහතා විදේශ සංචාරයක නිරත වීමට නියමිත 2024.08.09 දින සිට 2024.09.03 දින දක්වා කාල පරිච්ඡේදයේ අභියාචනාධිකරණයේ සභාපති ධුරයේ වැඩ බැලීමට අභියාචනාධිකරණ විනිශ්චයකාර ගරු ආර්.එම්. සෝභිත රාජකරුණා මහතා පත් කරන ලෙසට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (2) සහ 109 (1) ව්‍යවස්ථා යටතේ ගරු ජනාධිපතිතුමා විසින් කරන ලද නිර්දේශයක් සභාව විසින් සලකා බලන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (4) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව ගරු අග්‍රවිනිශ්චයකාරතුමා වෙතින් ලබා ගන්නා ලද අදහස් සභාව විසින් සලකා බලන ලදී. ඊට අනුකූලව, අභියාචනාධිකරණයේ සභාපති ගරු එන්.බී.පී.ඩී.එස්.කරුණාරත්න මහතා විදේශ සංචාරයක නිරත වීමට නියමිත 2024.08.09 සිට 2024.09.03 දක්වා කාල පරිච්ඡේදය තුළ අභියාචනාධිකරණයේ සභාපති ධුරයේ වැඩ බැලීමට අභියාචනාධිකරණ විනිශ්චයකාර ගරු ආර්. එම්.සෝභිත රාජකරුණා මහතා පත් කිරීම සඳහා වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය අනුමත කිරීමට 2024 ජූනි 18 වැනි දින පැවති සිය රැස්වීමේදී සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

5.3 අභියාචනාධිකරණයට විනිශ්චයකාරවරයන් පත් කිරීම

5.3.1. මහාධිකරණ විනිශ්චයකාරවරයන් වන කේ.එම්.ජී.එච්. කුලතුංග මහතා, ඩී. තොටවත්ත මහතා හා ආර්.ඒ. රණරාජා මහතා සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් මහේන් සී.එල්.බී. ගොපල්ලව මහතාගේ පත් කිරීම

පුරප්පාඩු වී පවතින අභියාචනාධිකරණයේ විනිශ්චයකාර ධුර සඳහා මහාධිකරණ විනිශ්චයකාර කේ.එම්.ජී.එච්. කුලතුංග මහතා, මහාධිකරණ විනිශ්චයකාර ඩී. තොටවත්ත මහතා, මහාධිකරණ විනිශ්චයකාර ආර්. ඒ. රණරාජා මහතා සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් මහේන් සී.එල්.බී. ගොපල්ලව මහතා පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාව යටතේ ගරු ජනාධිපතිතුමා වෙතින් ලද නිර්දේශ සභාව විසින් සලකා බලන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (4) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව ලබා ගන්නා ලද ගරු අග්‍රවිනිශ්චයකාරතුමාගේ අදහස් ද සභාව විසින් සලකා බලන ලදී.

නිර්දේශ කරනු ලැබ ඇති විනිශ්චයකාරවරයන් තිදෙනා මහාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයන් බව සභාව නිරීක්ෂණය කරන ලද අතර ගරු ජනාධිපතිතුමා විසින් නිර්දේශිත නාමිකයින් සිව්දෙනාම පත් කිරීම සඳහා ගරු අග්‍රවිනිශ්චයකාරතුමා විසින් එකඟතාව ප්‍රකාශ කරනු ලැබ ඇති බවද නිරීක්ෂණය කරන ලදී.

ඊට අනුව, 2024 සැප්තැම්බර් 03 වැනි දින පැවති සිය රැස්වීමේදී, සභාව විසින් පුරප්පාඩු වී තිබෙන අභියාචනාධිකරණ විනිශ්චයකාර ධුර සඳහා මහාධිකරණ විනිශ්චයකාර කේ.එම්.ජී.එච්. කුලතුංග මහතා, මහාධිකරණ විනිශ්චයකාර ඩී.තොටවත්ත මහතා, මහාධිකරණ විනිශ්චයකාර ආර්.ඒ. රණරාජා මහතා සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් මහේන් සී.එල්.බී. ගොපල්ලව මහතා පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ගරු ජනාධිපතිතුමා විසින් කරන ලද නිර්දේශ සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

5.3.2. මහාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාර කේ.එම්.එස්. දිසානායක මහතා සහ මහාධිකරණයේ ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාර ආර්.පී. හෙට්ටිආරච්චි මහතාගේ පත් කිරීම.

පුරප්පාඩු වී තිබෙන අභියාචනාධිකරණ විනිශ්චයකාර ධුර සඳහා මහාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාර කේ.එම්.එස් දිසානායක මහතා සහ මහාධිකරණ ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාර ආර්.පී. හෙට්ටිආරච්චි මහතා පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ ගරු ජනාධිපතිතුමා විසින් කරන ලද නිර්දේශය 2024 දෙසැම්බර් 31 වැනි දින පැවති රැස්වීමේදී, සභාව විසින් සලකා බලන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (4) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව ගරු අග්‍රවිනිශ්චයකාරතුමියගේ අදහස් ලබා ගැනීමට සභාව විසින් තීරණය කරන ලද අතර සභාවේ සලකා බැලීම සඳහා නාමිකයින්ගේ යථා පරිදි යාවත්කාලීන කරන ලද ජීවදත්ත පත්‍රිකා ජනාධිපති ලේකම්වරයාගෙන් ලබා ගැනීමට සභාව විසින් තවදුරටත් තීරණය කරන ලදී.

5.4 අධිකරණ සේවා කොමිෂන් සභාවට සාමාජිකයෙකු පත් කිරීම

5.4.1. ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ජනාධිපති නීතිඥ ගරු විජිත් කේ මලල්ගොඩ මහතා විශ්‍රාම යාමත් සමග ඇති වන පුරප්පාඩුව සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවට සාමාජිකයෙකු පත් කිරීම.

2024.08.26 දින ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ජනාධිපති නීතිඥ ගරු විජිත් කේ මලල්ගොඩ මහතා විශ්‍රාම යාමත් සමග පුරප්පාඩු වීමට නියමිත අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයට ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ජනාධිපති නීතිඥ ගරු එම්.එන්.බී. ප්‍රනාන්දු මහත්මිය පත් කිරීම පිණිස වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය 2024 අගෝස්තු 21 වැනි දින පැවති සිය රැස්වීමේදී සභාව විසින් සලකා බලන ලදී.

ජනාධිපති නීතිඥ ගරු එම්.එන්.බී. ප්‍රනාන්දු මහත්මිය ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරිය බව සභාව නිරීක්ෂණය කරන ලදී. ඊට අනුකූලව, නාමිකයාගේ ජීවදත්ත පත්‍රිකාව සමඟ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ සහ 111ඈ යන ව්‍යවස්ථාවන්හි

විධිවිධාන සලකා බැලීමෙන් අනතුරුව, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ජනාධිපති නීතිඥ ගරු විජිත් කේ මලල්ගොඩ මහතා විශ්‍රාම යාමත් සමග අධිකරණ සේවා කොමිෂන් සභාවේ ඇති වීමට නියමිත පුරප්පාඩුව සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර ජනාධිපති නීතිඥ ගරු එම්.එන්.බී. ප්‍රනාන්දු මහත්මිය පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා විසින් කරන ලද නිර්දේශය අනුමත කිරීමට සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

5.4.2. අග්‍රවිනිශ්චයකාර ජනාධිපති නීතිඥ ගරු ජයන්ත ජයසූරිය මහතා විශ්‍රාම යාමත් සමග ඇති වීමට නියමිත පුරප්පාඩුව සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවට සාමාජිකයෙකු පත් කිරීම

අග්‍රවිනිශ්චයකාර ජනාධිපති නීතිඥ ගරු ජයන්ත ජයසූරිය මහතා විශ්‍රාම යාම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර ජනාධිපති නීතිඥ ගරු එම්.එන්.බී. ප්‍රනාන්දු මහත්මිය 2024.12.02 දින අග්‍රවිනිශ්චයකාරවරිය ලෙස පත්වීමත් සමග අධිකරණ සේවා කොමිෂන් සභාවේ ඇති වීමට නියමිත පුරප්පාඩුව සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාර ගරු පී.පී. සූරසේන මහතා අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් සලකා බලන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර පී.පී. සූරසේන මහතා දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ සිටින ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයා බව සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. ඊට අනුකූලව, නාමිකයාගේ ජීවදත්ත පත්‍රිකාව සමඟ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ සහ 111ඈ යන ව්‍යවස්ථාවන්හි විධිවිධාන සලකා බැලීමෙන් අනතුරුව, සභාව විසින්, 2024 දෙසැම්බර් 20 වැනි දින පැවති සිය රැස්වීමේදී, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර ගරු පී.පී. සූරසේන මහතා අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කිරීම සඳහා වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය ඒකමතිකව අනුමත කරන ලදී.

5.5 නීතිපතිවරයා පත් කිරීම

5.5.1. නීතිපතිවරයා නැවත පත් කිරීම

2024.06.27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම යාමට නියමිත නීතිපති ජනාධිපති නීතිඥ එස්. රාජරත්නම් මහතා 2024.06.27 සිට 2024.12.31 දක්වා කාල පරිච්ඡේදය සඳහා නැවත පත් කිරීම සඳහා වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් 2024 ජූනි 4 වැනි දින පැවති සිය රැස්වීමේදී සලකා බලන ලදී. සලකා බැලීමෙන් අනතුරුව, අනිවාර්ය විශ්‍රාම වයසට එළඹීමෙන් පසු නීතිපතිවරයා නැවත පත්කිරීමට අදාළ නීතිමය ප්‍රතිපාදන සහ එසේ අනිවාර්ය විශ්‍රාම වයසට එළඹීමෙන් අනතුරුව නීතිපති ධුරයට තැනැත්තන් පත්කිරීමේ අතීත පූර්වාදර්ශද ඇතුළත් සවිස්තරාත්මක වාර්තාවක් සභාව විසින් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටින ලදී.

2024 ජූනි 18 වැනි දින පැවති සිය රැස්වීමේදී, සභාව විසින් මේ පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඉ ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය පිළිබඳව තීරණය කිරීමට සභාවේ සාමාජිකයන් විසින් සිය ඡන්දය ප්‍රකාශ කරන ලද අතර, ඊට අනුකූලව

2024.06.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම යාමට නියමිත නීතිපති ජනාධිපති නීතිඥ එස්. රාජරත්නම් මහතා 2024.06.27 සිට 2024.12.31 දක්වා කාල පරිච්ඡේදය සඳහා නැවත පත් කිරීම සඳහා වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් අනුමත කරනු නොලැබිණි.

5.5.2. නීතිපතිවරයා පත් කිරීම

2024.07.12. දින සිට පුරප්පාඩු වී පවතින නීතිපති ධුරයට ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ කේ.ඒ.පී රණසිංහ මහතා පත් කිරීම සඳහා වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව සභාව විසින් සලකා බලන ලදී.

සලකා බැලීමෙන් අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාව ප්‍රකාරව ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ කේ.ඒ.පී.රණසිංහ මහතා නීතිපති ධුරයට පත් කිරීම සඳහා වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය 2024 ජූලි 11 වැනි දින පැවැති රැස්වීමේදී සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

5.6 විගණකාධිපති ධුරයේ වැඩ බැලීම සඳහා පත් කිරීම

විගණකාධිපති ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න මහතා විදේශ සංචාරයක නිරත වීමට නියමිත 2024.12.08 සිට 2024.12.22 දක්වා කාල පරිච්ඡේදය තුළ විගණකාධිපති ධුරයේ වැඩ බැලීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාව ප්‍රකාරව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති ජී.එච්.ඩී ධර්මපාල මහතා පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් සලකා බලන ලදී.

නාමිකයා ජාතික විගණන කාර්යාලයේ සිටින ජ්‍යෙෂ්ඨතම නිලධාරියා බව සභාව නිරීක්ෂණය කරන ලදී. ඊට අනුකූලව, නාමිකයාගේ ජීවදත්ත පත්‍රිකාව සලකා බැලීමෙන් අනතුරුව, ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න මහතා, විගණකාධිපති විදේශ සංචාරයේ යෙදීමට නියමිත 2024.12.08 සිට 2024.12.22 දක්වා කාලපරිච්ඡේදය තුළ විගණකාධිපති ධුරයේ වැඩ බැලීමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති ජී.එච්.ඩී.ධර්මපාල මහතා පත්කිරීම සඳහා වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය අනුමත කිරීමට 2024 නොවැම්බර් 08 වැනි දින පැවති රැස්වීමේදී සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

5.7 පොලිස්පති ධුරයට පත් කිරීම

5.7.1. පොලිස්පති ධුරයේ වැඩ බැලීමට පත් කිරීම

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 67/24, 68/24,71/24, 72/24, 75/24, 80/24, 82/24, සහ 84/24 යන පෙත්සම් පිළිබඳ තීරණය ලබාදෙනු ලබන තෙක්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2024.07.24 දින දෙන ලද අතුරු තහනම් නියෝගය සැලකිල්ලට ගෙන, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ඩබ්ලිව්.එල්.ඒ.එස්.ප්‍රියන්ත මහතා 2024.10.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි පොලිස්පති ධුරයේ වැඩ බැලීමට පත්කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (2) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව සභාවේ අනුමැතිය ඉල්ලා සිටිමින් ගරු ජනාධිපතිතුමා විසින් කරන ලද නිර්දේශය සභාව විසින් 2024 ඔක්තොම්බර් 08 වැනි දින පැවති සිය රැස්වීමේදී සලකා බලන ලදී.

සාකච්ඡා කිරීමෙන් අනතුරුව, ශ්‍රේෂ්ඨාධිකරණ පෙත්සම් අංක 67/24, 68/24, 71/24, 72/24, 75/24, 79/24, 80/24, 82/24 සහ 84/24 පිළිබඳව අවසන් තීරණය ලබා දෙන තෙක් 2024.10.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ඩබ්ලිව්.එල්.ඒ.එස්.ප්‍රියන්ත මහතා පොලිස්පති ධුරයේ වැඩ බැලීමට පත් කිරීම සඳහා වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැර වෙනත් ලිඛිත නීති මගින් සභාව වෙත පනවා හෝ පවරා ඇති කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීම

6.1 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට (OMP) සාමාජිකයන් පත් කිරීම

6.1.1. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙහි සාමාජික ධුරයේ පුරප්පාඩු වූ තනතුරු හතර සඳහා සාමාජිකයින් පත් කිරීම

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජික ධුරයේ පුරප්පාඩු වූ තනතුරු හතර සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන් ලෙස පත් කිරීම සඳහා නිර්දේශ කරනු ලැබීමට සුදුසු තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවීමට සභාව විසින් පුවත්පත් දැන්වීමක් පළ කරන ලදී. මෙම දැන්වීමට අනුව, මුල් පිටපතට අමතර එවන ලද පිටපත් අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ ප්‍රමාද වී ලද අයදුම්පත්ද ඇතුළු මුළු අයදුම්පත් එකසිය හතක් (107) ලැබී තිබුණි.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ස්ථාපිත වර්ෂයේ සිට මේ දක්වා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සමස්ථ කාර්යසාධනය සහ 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටුකිරීම) පනතේ 23 වැනි වගන්තිය ප්‍රකාරව පළ කරන ලද වාර්ෂික වාර්තාවලට අදාළ වාර්තාවන් සභාව විසින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙන් ලබා ගන්නා ලදී.

දීර්ඝ ලෙස සලකා බැලීමෙන් අනතුරුව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටුකිරීම) පනතේ 4 සහ 7(1) වගන්තිවලට අනුව මහේෂ් කටුලන්ද මහතා, තම්බයියා යෝගරාජා මහතා සහ සිති ඩෙන් අර්ෆා තාසිම් මහත්මිය නැවත පත් කිරීමට 2024 ජූනි 18 වැනි දින පැවති රැස්වීමේදී සභාවේ බහුතරය විසින් නිර්දේශ කිරීමට තීරණය කරන ලද අතර වෛද්‍ය උපුල් අජිත් කුමාර තෙන්නකෝන් මහතා ද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයකු ලෙස පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ කිරීමටද සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

තවද, ඉහත කී පනතේ 4(1)(ආ) වගන්තියට අනුව මහේෂ් කටුලන්ද මහතා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙහි සභාපතිවරයා ලෙස පත්කිරීමට නිර්දේශ කිරීමට සභාව විසින් තීරණය කරන ලදී.

6.1.2. **එච්.එම්.එම්.බී. ජයවර්ධන මහතා සහ පී.එම්.ඩබ්ලිව් සම්පත් පෙරේරා මහතා ඉල්ලා අස්වීම හේතුවෙන් ඇතිවූ පුරප්පාඩු දෙක සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සඳහා සාමාජිකයන් පත්කිරීම**

එච්.එම්.එම්.බී.ජයවර්ධන මහතා සහ පී.එම්.ඩබ්ලිව්.සම්පත් පෙරේරා මහතා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජික ධුරයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ඇති වී තිබෙන පුරප්පාඩු දෙක පිළිබඳව සභාවට දන්වමින් ජනාධිපති ලේකම්වරයාගෙන් ලැබුණු සන්නිවේදනය සභාව විසින් සලකා බලන ලදී.

ඊට අනුකූලව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට සාමාජිකයින් පත් කිරීම සඳහා නිර්දේශ කරනු ලැබීමට සුදුසු තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවීමට පුවත්පත් දැන්වීමක් පළ කිරීමට 2024 නොවැම්බර් 08 වැනි දින පැවති සිය රැස්වීමේදී සභාව විසින් තීරණය කරන ලදී. පළ කරන ලද දැන්වීමට අනුව, ප්‍රමාද වී ලද අයදුම්පත්, මුල් පිටපතට අමතර එවන ලද පිටපත් අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ඇතුළු මුළු අයදුම්පත් එකසිය විස්සක් (120) ලැබී තිබුණි.

6.2 හානිපූරණය සඳහා වන කාර්යාලයට සාමාජිකයෙකු පත් කිරීම

හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලද මේජර් ජෙනරාල් ඩබ්ලිව්.පී.පී. ප්‍රනාන්දු මහතාගේ ධුර කාලය අවසන් වීම හේතුවෙන් හානිපූරණය සඳහා වන කාර්යාලයේ සංයුතියේ පුරප්පාඩුවක් ඇතිවී තිබෙන බව සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. මේජර් ජෙනරාල් ඩබ්ලිව්.පී.පී. ප්‍රනාන්දු මහතාගේ ධුර කාලය තුළදී ධුරයේ කටයුතු සඳහා ඔහු දැක්වූ සුවිශේෂී දායකත්වය සැලකිල්ලට ගනිමින් ඔහුව නැවත පත්කිරීමට හානිපූරණය සඳහා වන කාර්යාලයේ සභාපතිවරිය විසින් නිර්දේශ කරනු ලැබ ඇති බවත් සභාව වෙත දන්වා ඇත. සාකච්ඡා කිරීමෙන් අනතුරුව, හානිපූරණය සඳහා වන කාර්යාලයේ පාර්ලිමේන්තුවේ සභාගත කර තිබෙන වාර්තා ද ඉන් අනතුරුව, මේජර් ජෙනරාල් ඩබ්ලිව්.පී.පී. ප්‍රනාන්දු මහතා හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයෙකුව සිටියදී ලබාදුන් දායකත්වය සහ ඉටුකරන ලද කාර්යභාරය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සභාව විසින් ලබා ගන්නා ලදී.

සලකා බැලීමෙන් අනතුරුව, සභාව විසින් 2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනතේ 4 සහ 6 වගන්ති ප්‍රකාරව, මේජර් ජෙනරාල් ඩබ්ලිව්.පී.පී. ප්‍රනාන්දු මහතා හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයෙකු ලෙස නැවත පත් කිරීම සඳහා 2024 ජූලි 26 වැනි දින පැවති රැස්වීමේදී නිර්දේශ කිරීමට සභාවේ බහුතර තීරණය මඟින් නිර්දේශ කරන ලදී.

6.3 ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ (PUCSL) සභාපතිවරයා සහ සාමාජිකයින් පත් කිරීම

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙහි සභාපතිවරයා සහ සාමාජිකයින් පත් කිරීම සඳහා සභාවේ එකඟතාවය ඉල්ලා සිටිමින් 2024.07.15 දිනැතිව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් ලද සන්නිවේදනයක් 2024 ජූලි 26 වැනි දින පැවති සිය රැස්වීමේදී සලකා බලන ලදී. ඒ සඳහා වූ නාමයෝජනා සලකා බලමින් සිටින අවස්ථාව වන විට ජනාධිපතිවරණය පවත්වා තිබූ අතර, අදාළ විෂයභාර අමාත්‍යවරයා වෙනස් වී තිබුණි.

එවකට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් කරන ලද නිර්දේශය වත්මන් ගරු මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යතුමා විසින් අනුමත කරන්නේද යන්න තහවුරු කර ගැනීමට සභාව විසින් තීරණය කරන ලදී.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ (PUCSL) සාමාජිකයින් ලෙස මහාචාර්ය කේ.පී.එල්. චන්ද්‍රලාල් මහතා, මහාචාර්ය ඩබ්ලිව්.ඩී.ඒ.එස්. රුද්‍රිගෝ මහතා, ආචාර්ය එම්.සී.එස්. ප්‍රනාන්දු මහත්මිය, පී. හෙන්නායක මහතා සහ විනිසුරු ඩබ්ලිව්.ඒ.කළුආරච්චි මහතා පත් කිරීම සඳහා සභාවේ එකඟතාවය ඉල්ලා සිටිමින් ගරු මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යතුමා වෙතින් 2024.11.08 දිනැතිව සන්නිවේදනයක් සභාව වෙත ලැබුණි. සභාවේ සලකා බැලීම සඳහා, සභාව විසින්, සාකච්ඡාවක් සඳහා ඉහත නම් කරන ලද නාමිකයන් වෙත ආරාධනා කරන ලදී.

සලකා බැලීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස මහාචාර්ය කේ.පී.එල්. චන්ද්‍රලාල් මහතා, මහාචාර්ය ඩබ්ලිව්.ඩී.ඒ.එස්. රුද්‍රිගෝ මහතා, ආචාර්ය එම්.සී.එස්. ප්‍රනාන්දු මහත්මිය, පී. හෙන්නායක මහතා සහ විනිසුරු ඩබ්ලිව්.ඒ. කළුආරච්චි මහතා පත් කිරීමට 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ 3(1) සහ 6(5) වගන්ති ප්‍රකාරව ගරු මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යතුමා විසින් කරන ලද නාමයෝජනා සඳහා ඉහත කී පනතේ අවශ්‍යතාවලට අනුකූලව අදාළ නාමිකයන් විසින් දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය යන කොන්දේසියට යටත්ව 2024 නොවැම්බර් 15 වැනි දින පැවති සිය රැස්වීමේදී සභාව ඒකමතිකව එකඟ විය.

විනිසුරු ඩබ්ලිව්.ඒ.කළුආරච්චි මහතා සහ මහාචාර්ය ඩබ්ලිව්.ඩී.ඒ.එස්. රුද්‍රිගෝ මහතා විසින් පත්වීම භාර නොගැනීම හේතුවෙන් පුරප්පාඩු වී ඇති ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සමාජික ධුර සඳහා ඩබ්ලිව්.ආර්.ද මෙල් මහතා සහ ටී.බී.අබේසේකර මහතා පත්කිරීමට සභාවේ එකඟතාව ඉල්ලා ගරු මුදල්, සැලසුම් හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙතින් ලද 2024.12.22 දිනැති සන්නිවේදනයක් සභාව විසින් සලකා බලන ලදී. සාකච්ඡා කිරීමෙන් අනතුරුව, සභාව විසින්, 2024 දෙසැම්බර් 31 වැනි දින පැවති සිය රැස්වීමේදී, නාමිකයින් වෙත සාකච්ඡාවක් සඳහා ආරාධනා කිරීමට තීරණය කරන ලද අතර 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ 5 වැනි වගන්තියේ අවශ්‍යතා ප්‍රකාරව නාමිකයින්ගෙන් දිවුරුම් ප්‍රකාශ ලබා ගැනීමටද තවදුරටත් තීරණය කරන ලදී.

6.4 කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට (NCW) සාමාජිකයින් පත් කිරීම

2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත ප්‍රකාරව කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව පිහිටුවීම සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්වරයාගෙන් ලැබුණු සන්නිවේදනයක් සභාව විසින් සලකා බලන ලදී.

ඊට අනුකූලව, ඉහත කී පනතේ විධිවිධානවලට අනුකූලව, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට සාමාජිකයින් පස් (05) දෙනකු පත් කිරීම සඳහා අයදුම්පත් / නාමයෝජනා කැඳවීමට පුවත්පත් දැන්වීමක් පළ කිරීමට 2024 දෙසැම්බර් 20 වැනි දින පැවති රැස්වීමේදී සභාව විසින් තීරණය කරන ලදී.

7. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු සඳහා පහත සඳහන් ඉල්ලීම් සංඛ්‍යාවක් ලැබී ඇති අතර, මෙහි දක්වා ඇති පරිදි ප්‍රතිචාර ලබා දී ඇත:

ලැබුණු ඉල්ලීම් ගණන	2
තොරතුරු සම්පූර්ණයෙන් / අර්ධ වශයෙන් සපයන ලද ඉල්ලීම් ගණන	2
ප්‍රතික්ෂේප හෝ නිෂ්ප්‍රභා කරන ලද ඉල්ලීම් ගණන	0
අභියාචනා ගණන	1
පිළිතුරු සපයන ලද අභියාචනා ගණන	1
ප්‍රතික්ෂේප වූ අභියාචනා ගණන	0

8. ආඥාඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් වගඋත්තරකරුවන් ලෙස සඳහන් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ලැබ ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම්:-

i. SC FR 317/2023
ii. SC FR 318/2023
iii. SC FR 319/2023
iv. SC FR 04/2024
v. SC FR 06/2024
vi. SC FR 12/2024
vii. SC FR 14/2024
viii. SC FR 67/2024
ix. SC FR 75/2024
x. SC FR 80/2024
xi. SC FR 71/2024
xii. SC FR 72/2024
xiii. SC FR 79/2024
xiv. SC FR 82/2024
xv. SC FR 68/2024
xvi. SC FR 84/2024
xvii. SC FR 35/2024
xviii. SC FR 105/2024
xix. SC FR 110/2024
xx. SC FR 113/2024
xxi. SC FR 137/2024

i.